**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ</u>**

**<u>හෙද පුහුණු පාඨමාලාවට බඳවා ගැනීම පිණිස</u>**

**<u>අන්තර්ජාලය හරහා ඉදිරිපත්කල යුතු අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්</u>**

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය සහ මෙම උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලු කරුණු ඉතා හොඳින් කියවන්න.

අයදුම්පත් ඉදිරිපත් කල යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ www.health@gov.lk නිළ වෙබ් අඩවිය ඔස්සේ පමණි.

<u>මේ සඳහා සුදුසුකම් ලබන්නේ 2018 වර්ෂයේ හෝ 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ යන අවස්ථාවලින් එකකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයට විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිට සමත් වූවන් පමණි.</u> ( අදාල තොරතුරු ගැසට් නිවේදනයේ ඡේද අංක 02. යටතේ දැක්වෙන අංක 01 වගුවේ සඳහන් වේ.)

**අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2022.01.31 වේ.**

**එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි.**

<u>ඉතා වැදගත් -</u>

එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත්කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. එක් අයදුම්පතකට වඩා වැඩියෙන් ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන්ගේ සියලු අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2018 සහ 2019 යන වර්ෂ දෙකෙන්ම අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් අයෙකුට වුවද ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. එවැනි අයදුම්කරුවන්ට තම මනාපය අනුව තෝරාගනු ලබන එක් වර්ෂයකින් පමණක් අයදුම්පතක් ඉදිරිපත් කල හැකිය. වර්ෂ දෙකෙන්ම අයදුම්පත් ඉදිරිපත් නොකල යුතුය. එසේ නොමැතිව වර්ෂ දෙකෙන්ම අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වේ නම් එකී සියලු අයදුම්පත් ද කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පසුගිය බඳවාගැනීම් වලදී සාවද්‍ය තොරතුරු (විභාග වලට පෙනී සිටි වර්ෂ, විෂයයන් සඳහා ලබා ඇති ශ්‍රේණි, ලබා ඇති Z අගය යනාදී දත්ත වෙනස්කර) වංචා සහගත ලෙස ඇතුලත් කර අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අයදුම්කරුවන් සුළු පිරිසක් පිළිබඳව නිරීක්ෂණය විය. මෙය බරපතල වරදකි. එබැවින් කිසිඳු අයදුම්කරුවෙකු තමා විසින් ඉදිරිපත් කරනු ලබන විද්‍යුත් අයදුම්පතට සාවද්‍ය තොරතුරු ඇතුලත් නොකල යුතුය. සාවද්‍ය තොරතුරු ඇතුලත්කර ඉදිරිපත් කර ඇති සෑම අයදුම්පතක්ම කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කර, එවැනි අයදුම්කරුවන්ට විරුද්ධව නිත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකරන අතර ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුලත් කිරීමටද කටයුතු කරනු ලැබේ.

සෑම අයදුම්කරුවෙකු විසින්ම පළමුව මෙම ගැසට් නිවේදනයේ සහ මෙහි සඳහන් සියලුම කරුණු ඉතා හොඳින් කියවා තේරුම්ගෙන මෙම පාඨමාලාව සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට තමන් සුදුස්සෙකු බවට තහවුරු කර ගත යුතුය. ඔබ එලෙස සුදුසුකම් සහිත අයෙකු නම් පමණක් ගැසට් නිවේදනයේ අංක 7.2 ඡේදයේ දක්වා ඇති පරිදි බැංකුවට රු. 500/- ක මුදලක් ගෙවා රිසිට්පතක් ලබාගන්න. අනතුරුව එම රිසිට්පත ඇතුලු පහත සඳහන් ලේඛණ සහ තොරතුරු අතැතිව අයදුම්පත සම්පූර්ණ කිරීම ආරම්භ කරන්න.

**ඒ අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා අයදුම්කරු සතුව තිබිය යුතු ලේඛන හා තොරතුරු.**

- **ජාතික හැඳුනුම්පත**
- **ඔබගේ උස (සෙ.මී) වලින් දැක්විය යුතුය**
- **අ.පො.ස. (සා.පෙළ) / (උ.පෙළ) සහතික සහ Z අගය දැක්වෙන ලේඛනය**
- **ඇමතුම් ලබාදියහැකි ජංගම දුරකථන අංකයක්**
- **ගැසට් පත්‍රයේ 7.2. ඡේදය අනුව රු. 500/- ක ගාස්තුව බැංකුවට ගෙවීමෙන් පසු ලබාගත් රිසිට්පත**

ජංගම දුරකථන අංකයක් ඇතුලත් කල යුතුය. අයදුම්කරුට තමාගේ සහ පියාගේ හෝ මවගේ හෝ භාරකරුගේ හෝ ජංගම දුරකථන අංකයද ඇතුලත් කල හැකිය.

ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් හෝ මුදල් තැම්පත් කිරීමේ යන්ත්‍රයකින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මගින් හෝ රු.500/- ක මුදලක් ලංකා බැංකුවේ තැපොබේන් ශාඛාවේ ගිණුම් අංක 7041318 දරණ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවා ලබාගත් ලදුපතේ මුද්‍රිත අංකය අයදුම්පතේ නියමිත ස්ථානයට ඇතුලත් කල යුතුය. මුදල් ගෙවීමෙන් පසු ලබාගත් රිසිට්පත අයදුම්කරු සන්තකයේ සුරක්ෂිතව තබා ගත යුතුය. (ටෙලර් යන්ත්‍රයක් මගින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මඟින් ගෙවීම් සිදුකලේ නම් එම රිසිට්පතෙහි සඳහන් දත්ත පසුකාලීනව මැකී යාමට ඉඩ ඇති බැවින් මුල් පිටපතට අමතරව එහි ඡායා පිටපතක්ද සුරක්ෂිතව තබාගන්න)

**අන්තර්ජාලය හරහා අයදුම්පත සම්පූර්ණ කිරීමේදී සැලකිය යුතු කරුණු ;**

1. අයදුම්පත සම්පූර්ණ කල යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.
2. අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී යොදාගත් ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කල යුතුය.
3. අදාල විභාග අංක ඇතුලත් කල පසු අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ස්වයංක්‍රීයව උත්පාදනය වේ. කෙසේ වෙතත් එම ප්‍රතිඵල වල කිසියම් වෙනසක් තිබේ නම්, ඔබ සතුව ඇති ප්‍රතිඵල ලේඛණයේ සඳහන් ප්‍රතිඵල අයදුම්පතෙහි ඊට පහලින් ඇති කොටසෙහි සඳහන් කල යුතුය.

<u>විශේෂ අවධානයට</u>

ගැසට් නිවේදනය සහ ඉහත උපදෙස් ඉතා හොඳින් කියවා තේරුම් ගෙන මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට විද්‍යුත් අයදුම්පත පිරවීමේදී කිසියම් තාක්ෂණික ගැටළුවක් මතුවුවහොත් එම තාක්ෂණික ගැටළුව විසඳා ගැනීම සඳහා පමණක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ සම්බන්ධීකරණ අංශයේ 0112 340 007 දුරකථනයට සතියේ දිනවල (රජයේ නිවාඩු දින හැර) ඇමතීමෙන් උපදෙස් ලබාගත හැකිය. **වෙනත් කරුණු පිළිබඳව විමසා ඇමතුම් ලබාදීමෙන් වලකින්න.**

- සම්පූර්ණ කරන ලද අයදුම්පත අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමෙන් පසුව එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන ඔබ සන්තකයේ තබාගන්න. **<u>එය තැපෑලෙන් එවීම නොකල යුතුය.</u>**